www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ "සාම" පක්ෂය එල්ටීටීඊයට එරෙහි ආන්ඩුවේ යුද්ධයට බකිම දෙයි

## Sri Lanka's "peace" party backs the government's war on the LTTE

**විලානි පීරිස් විසිනි**

**2006 සැප්තැම්බර් 14**

"ජාතික ප්‍රශ්නය" පිලිබඳ ශ්‍රී ලංකා ආන්ඩුවේ ප්‍රවිෂ්ටයට විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) දෙන සහයෝගය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ආක්‍රමනික යුද්ධයක් ගෙන යාම පිලිබඳව කොලඹ පාලක කව තුල පවත්නා පොදු එකඟතාව සම්බන්ධ පැහැදිලි දර්ශකයකි.

2002 දී, එජාප නායකත්වයෙන් යුත් ආන්ඩුව එල්ටීටීඊය සමග නිල සටන් විරාමයක් අත්සන් කොට රටේ 20 අවුරුදු සිවිල් යුද්ධය සාකච්ඡාමය බලය බෙදා ගැනීමේ සම්මුතියකින් විසඳන බවට පොරොන්දු විය. ඉන් සිව් වසරකට පසුව, ජනාධිපති මහින්ද රාජපක්ෂ පසු ගිය ජුලි මාසයේ දී එල්ටීටීඊ භූමි ප්‍රදේශය තුල පැවති මාවිල්ආරු වාරිමාර්ග සොරොව්ව අල්ලා ගනු පිනිස මිලිටරි ආක්‍රමනයක් දියත් කරන ලෙස අන කිරීමෙන් අනතුරුව එම සටන් විරාමය නමට පමනක් සීමා වී ඇත. රාජපක්ෂගේ ක්‍රියාවන් හෙලා දකිනවා වෙනුවට එජාපය ඔහුගේ පිලිවෙතට එකඟ වී තිබේ.

සඳුදා එජාප නායක රනිල් වික්‍රමසිංහ රාජපක්ෂ හමු වී සාකච්ඡා පැවැත්වීමෙන් පසුව පක්ෂ ප්‍රකාශක ජොන්ස්ටන් ප්‍රනාන්දු ප්‍රකාශ කලේ, එජාපය ජාතික ප්‍රශ්නය විසඳනු පිනිස "ද්වි-පක්ෂ ප්‍රවිෂ්ටයකට" "පූර්න වසයෙන් කැප වන" බව යි. නරක අතට හැරෙන ජනවාර්ගික ගැටුම විසඳීමට රාජපක්ෂ අපොහොසත් වීම ගැන විවේචනශීලී වන අතර ම ප්‍රනාන්දු කියා සිටියේ, එජාපය ආන්ඩුව සමග සාකච්ඡාවලට අවතීර්න වී ඇත්තේ "වගකිව යුතු හා ශුභවාදී අර්ථයකින්" බව යි.

"ජාතික ප්‍රශ්නය" යනු යුද්ධයත් ඒ සඳහා තුඩු දුන් මුල් බැස ගත් දෙමල විරෝධී වෙනස්කම් කිරීමත් විස්තර කිරීමට කොලඹ දේශපාලන සංස්ථාපිතය තුල යොදා ගන්නා උපක්‍රමික වචනය යි. යුද්ධය අවසන් කිරීමට තමන් ම දැරූ ප්‍රයත්නයන්ගේ පදනම රාජපක්ෂ විසින් තථ්‍ය වසයෙන් ම බිඳ දමනු ලැබ ඇති බව එජාපය හොඳින් දනී. ෆෙඩරල් රාජ්‍යයක් තුල දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල එල්ටීටීඊ පරිපාලනයකට එක්තරා ස්වතන්ත්‍ර භාවයක් ලබා දීමට එජාපය එකඟ වී තිබුනි.

පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනය තුල දී රාජපක්ෂ සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග මැතිවරන ගිවිසුමක් අත්සන් කල අතර, එමගින් මොන ම ආකාරයක හෝ ෆෙඩරල්වාදයක් ප්‍රතික්ෂේප කෙරුනු අතර සටන් විරාමය සංශෝධනය කරන ලෙසත් හමුදාව ශක්තිමත් කරන ලෙසත් ඉල්ලා සිටියේ ය. මෙම ප්‍රකෝපකාරී ආස්ථානය විවෘත යුද්ධය කරා යලි ඇද වැටීමේ වත්මන් වර්ධනයන් සඳහා කොන්දේසි සැකසී ය. මේ සතියේ වික්‍රමසිංහ ජනාධිපති හමු වන විට පවා, රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) විවෘතව ම යුද්ධය ඉල්ලා සිටින ජවිපෙ සමග නිල සභාගයක් සඳහා සාකච්ඡා ක්‍රියා දාමයක නිරතව සිටියේ ය.

රාජපක්ෂ "ජනවාර්ගික ගැටුම" අවසන් කිරීමට අපොහොසත් වීම ගැන ඇල් මැරුනු විවේචන කරන අතර ම එජාපය යුද්ධයට සහාය දීම පිනිස තථ්‍ය වසයෙන් ම සිය මුලු ශක්තිය යොදවා තිබේ. පසු ගිය මාස දෙක මුලුල්ලේ ම එජාප නායකයන් ආන්ඩුවේ ක්‍රියාවන් හා මිලිටරියේ ජන ඝාතන නැවත නැවතත් ආරක්ෂා කර තිබේ.

අගෝස්තු 15 දා නියෝජ්‍ය නායක කරු ජයසූරියගේ නායකත්වයෙන් යුත් එජාප නියෝජිත කන්ඩායමකට ජනාධිපති විසින් "ආරක්ෂක තත්වය" ගැන පැහැදිලි කරන ලදි. මිලිටරියේ අඛන්ඩ මෙහෙයුම් "ආරක්ෂක ක්‍රියාවන්" බව කියා සිටි රාජපක්ෂ, පෙර දින ගුවන් හමුදා බෝම්බ ප්‍රහාරයකින් පාසල් ශිෂ්‍යයන් 61 දෙනෙකු ඝාතනය වීම යුක්ති යුක්ත කලේ ය. ඉන් දින දෙකකට පසුව එජාප ප්‍රකාශක ජී.එල්. පීරිස් ඩේලි මිරර් පත්‍රයට මෙසේ පැවසී යඃ "ඇත්ත වසයෙන් ම රට ආරක්ෂා කිරීම රාජ්‍යයේ වගකීමක්. අවශ්‍ය විට මිලිටරි ක්‍රියාවන්ට එලඹීම ඒ සඳහා අවශ්‍ය කරනවා."

අගෝස්තු 24 දා රාජපක්ෂ එජාපයේ "පූර්න සහයෝගය" ඉල්ලා සිටිමින් ජයසූරිය වෙත ලිපියක් යැවූ අතර එහි මෙසේ කියා සිටියේ යඃ "අපගේ මව්බිම ආරක්ෂා කර ගැනීමේ අභියෝගයට මුහුන දෙනු පිනිස මගේ ආන්ඩුවට එක් වන ලෙස ඔබෙන් හා ඔබ පක්ෂයෙන් මම උදක් ම ඉල්ලා සිටිමි." රාජපක්ෂ හා වික්‍රමසිංහ අතර මේ සතියේ පැවති හමුවෙන් පසුව එජාපය තමන් "ජාතික ආන්ඩුවකට" එකතු වීමට ඇති ඉඩකඩ ප්‍රතික්ෂේප කල නමුත් එම පක්ෂය යුද්ධය සඳහා සිය "පූර්න සහයෝගය" දී ඇති බව පැහැදිලි ය.

2002 සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කරමින් පසු ගිය සතියේ මිලිටරිය සාම්පූර් නම් මූලික නගරය අල්ලා

ගැනීමෙන් පසුව එජාපය එම ජයග්‍රහනය "සාදරයෙන් පිලිගත්තේ ය." සැප්තැම්බර් 6 දා පාර්ලිමේන්තුවේ දී කතා කරමින් එජාප මන්ත්‍රී ජෝන් අමරතුංග මෙසේ ප්‍රකාශ කලේ යඃ "මෑත දී ලද ජයග්‍රහනයන් වෙනුවෙන් අපගේ සන්නද්ධ හමුදාවන්ට ආචාරය පුද කරන අපි එම ක්‍රියාවේ දී මිය ගිය අය වෙනුවෙන් අපගේ ශෝකය ද පල කරනවා." එදින ම එජාප නියෝජ්‍ය ප්‍රධාන ලේකම් තිස්ස අත්තනායක ඩේලි මිරර් පත්‍රයේ මෙසේ පැවසී යඃ "ජාතික ආරක්ෂාව හා රටේ ස්වෛරී භාවය වෙනුවෙන් ඕනෑ ම පක්ෂ පිලිවෙතක් කැප කිරීමට පක්ෂය නිරතුරුව ම සූදානම්."

එජාපය යුද්ධයට සහාය දීම පුදුමයට කරුනක් නො වේ. ශ්‍රීලනිපය මෙන් ම තත්වාරක්ෂක එජාපය ද සිංහල ස්වෝත්තමවාදය තුල ගැඹුරට ම ගිලී සිටින අතර සිවිල් යුද්ධයේ ආරම්භය සලකුනු කල 1983 දෙමල විරෝධී ජන ඝාතන ව්‍යාපාරය මුදා හැරීමෙහි ලා සෘජුව ම වගකිව යුතු විය. ආනුෂංගික එජාප ආන්ඩු 1994 දී බලයෙන් පහ වීමට පෙර දශකයකට වැඩි කලක් තිස්සේ ම්ලේච්ඡ ලෙස යුද්ධය පෙරට ගෙන ගියේ ය.

එජාපය 2002 දී සාම සාකච්ඡා සඳහා හැරී ගැනීම වැඩ කරන ජනතාව කෙරෙහි යුද්ධයෙන් සිදු වී තිබෙන ව්‍යසනකාරී බලපෑම ගැන උපන් මොන යම් හෝ උත්සුකතාවක් නිසා සිදු වූවක් නො ව, යුද්ධයේ ආර්ථික ප්‍රතිවිපාක ගැන සංගත ප්‍රභූ ස්තර තුල පවත්නා අසහනය පිලිබිඹු කිරීමක් විය. 2000 දී එල්ටීටීඊය මිලිටරිය මත පරාජයන් මාලාවක් පැටවීමෙන් පසුව මොන යම් හෝ ක්ෂනික මිලිටරි ජයග්‍රහනයක් පිලිබඳ බලාපොරොත්තු මුලුමනින් ම බිඳ වැටී තිබුනි. එක්සත් ජනපදයට එල්ල වූ සැප්තැම්බර් 11 ප්‍රහාරවලින් අනතුරුව, "ත්‍රස්තවාදී එල්ටීටීඊය" තමන්ගේ කොන්දේසි මත සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීම පිනිස ජාත්‍යන්තර සහයෝගය ගොනු කර ගැනීමට ඇති අවස්ථාව පාලක ප්‍රභූහු දුටහ.

ඊනියා සාම ක්‍රියා දාමයේ බිඳ වැටීමත් යුද්ධය යලි ඇවිලවීමට එජාපය දැන් දෙන සහයෝගයත් මගින් අවධාරනය කෙරෙන්නේ යුද්ධය අවසන් කිරීමට සමස්ත දේශපාලන සංස්ථාපිතයට ම පවත්නා නොහැකියාව යි. 2002 සටන් විරාමය අත්සන් කල වහා ම වික්‍රමසිංහ ආන්ඩුව මුහුන දුන්නේ එල්ටීටීඊයට උවමනාවට වඩා සහන දීම ගැන සිංහල අන්තවාදීන් එල්ල කල තියුනු විවේචන මාලාවකට ය. එල්ටීටීඊය සමග සාකච්ඡා ඉදිරියට යද්දී රට බෙදීමට සූදානම් වන්නේ යැයි ජවිපෙ ආන්ඩුව හෙලා දුටුවේ, එල්ටීටීඊය දෙමල ඊලම් නමින් වෙන ම රාජ්‍ය කැබලිත්තක් පිලිබඳ සිය ඉල්ලීම නිල වසයෙන් අත හැර දමා තිබිය දී ය.

හිටපු ජනාධිපති හා ශ්‍රීලනිප නායිකා චන්ද්‍රිකා කුමාරතුංග සමස්ත සාම ක්‍රියා දාමයට ම ජවිපෙ හා මිලිටරිය දැක්වූ විරුද්ධත්වයේ කේන්ද්‍රය බවට වඩ වඩාත් පත් විය. කුමාරතුංගගේ රහස් සහයෝගය යටතේ ප්‍රකෝපකාරී ලෙස එල්ටීටීඊ යාත්‍රා ගනනාවක් ම ගිල්වා දැමීම මගින් නාවික හමුදාව සිදු වෙමින් පැවති සාකච්ඡාවන්ට වල කැපී ය. එල්ටීටීඊය අවසානයේ 2003 අප්‍රේල් මස සාකච්ඡාවලින් ඉවත් විය. 2003 නොවැම්බරයේ දී එජාප ආන්ඩුව හා එල්ටීටීඊය සාකච්ඡා යලි පන ගැන්වීමේ උත්සාහයක යෙදෙමින් සිටිය දී, කුමාරතුංග ජවිපෙ පීඩනය යටතේ ඇගේ විධායක ජනාධිපති බලතල යොදා ගෙන "ජාතික ආරක්ෂාවේ" නාමයෙන් මූලික ඇමතිවරුන් තිදෙනෙකු තනතුරුවලින් පහ කලා ය.

කුමාරතුංගගේ අසාමාන්‍ය පියවරයන්ට ප්‍රතිචාර දැක්වීමෙහි ලා එජාපය දැක්වූ නොහැකියාව පිලිබිඹු කලේ එජාපය ද එම වාර්ගික දේශපාලනයේ ම ගිලී සිටි බව යි. රට පාවා දෙමින් සිටින බවට විරුද්ධ පක්ෂය එල්ල කල විවේචන ප්‍රවාහයට එජාපය අතිශයින් ම සංවේදීව සිටි බැවින්, සමස්ත සාකච්ඡා ක්‍රියා දාමය පුරා ම එල්ටීටීඊය සමග කිසිදු අවසන් දේශපාලන සම්මුතියක් ගැන මොන යම් හෝ සාකච්ඡාවක් සිදු නො වී ය. "සාම ක්‍රියා දාමය" කිසි දා යලි පන ගැන්වුනේ නැත. 2004 පෙබරවාරියේ දී කුමාරතුංග ජවිපෙ සමග මැතිවරන පෙරමුනක් තනා හිතුවක්කාරී ලෙස ආන්ඩුව බලයෙන් පහ කොට නව මැතිවරනයක් කැඳවූවා ය.

එජාපය 2004 මැතිවරනයෙන් පරාජය වූයේ ඡන්දදායකයන්ට යුද්ධය අවශ්‍ය වූ නිසා නො ව එහි සාම සැලසුම් රුදුරු ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලකට ගැට ගසා තිබූ බැවිනි. එජාපයට යුද්ධය අවසන් කිරීමට අවශ්‍ය වූයේ විදේශ ආයෝජන ආකර්ෂනය කර ගෙන දිවයින "දකුනු ආසියාවේ හොං කොං දේශය" බවට පරිවර්තනය කිරීම පිනිස ය. එහි පුද්ගලීකරන හා අත්‍යවශ්‍ය සේවා කප්පාදු කිරීමේ පිලිවෙත් රැකියා කප්පාදුවකට හා ජීවන මට්ටම්වල කැපී පෙනෙන කඩා වැටීමකට තුඩු දුනි. එම හේතු නිසා ම පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනයේ දී වික්‍රමසිංහ රාජපක්ෂට යන්තමින් පැරදුනි.

1994 පටන් මේ වන තෙක් බලගතු ජනාධිපති තනතුර ජය ගැනීමට අපොහොසත්ව ඇති එජාපය තුල මෙම මැතිවරන පරාජයෙන් ගැඹුරු අසහනකාරී හැඟීම් නිර්මානය විය. ඔවුන්ගේ මන්ත්‍රීවරු හය දෙනෙක් පිල මාරු කොට රාජපක්ෂ ආන්ඩුවට එක් වූහ. තවත් පක්ෂ කන්ඩායමක් වඩා ආක්‍රමනශීලී ලෙස වාර්ගික දේශපාලනය ඉදිරියට ගෙන යනු වස් නියෝජ්‍ය නායක ජයසූරිය පක්ෂ නායක තනතුර භාර ගත යුතු බවට බල කරමින් සිටිති. එජාපයේ අභ්‍යන්තර පක්ෂ මතභේදවල ප්‍රතිඵලය කුමක් වුවත්, එය දිවයින යලිත් ව්‍යසනකාරී සිවිල් යුද්ධයකට ඇද දැමීමේ රාජපක්ෂගේ තීන්දුවට එරෙහි වීමට නොයන බව නම් පැහැදිලි ය.

© www.wsws.org